හිටියා චිත්‍ර ගුරුවරයෙක්. එයාගේ අතේ නිතරම වාගේ හුණු කෑල්ලක් තියනවා. කොහෝ හරි ගියාම එතැන චිත්‍රයක් අඳිනවා. වැඩිපුරම අඳින්නේ අලියෙකුයි ගිරවෙකුයි. දවසක් මෙයා අපේ ගෙදර ආව වෙලාවක ගෙයි බිත්තියේ මේ අලියයි ගිරවයි ඇඳලා ගියා. එයා ගියාට පස්සේ මම ඒක බලාගෙන ඒකට යටින් ඒ විදිහටම අලියයි ගිරවයි ඇන්දා. පස්සේ දවසක මේක දැකලා එයා අපේ තාත්තගෙන් ඇහුවා කවුද මේක ඇන්දේ කියලා. මම ඇන්දේ කිව්වාම තාත්තට කියලා තියනවා කවද හරි මෙයා හොඳ චිත්‍ර ශිල්පියෙක් වෙයි කියලා. ඉස්කෝලේ යන කාලෙත් ඔය වගේ පොඩි පොඩි රේඛා චිත්‍ර ඇන්දා. ඒවා ඇඳලා ගුටි කාලත් තියනවා. අනෙක් ළමයි වගේම පන්තියේදී මමත් චිත්‍ර විෂයක් විදිහට ඉගෙන ගත්තා ඇර චිත්‍ර ගැන වෙනම විශේෂ අධ්‍යාපනයක් ලැබුවේ නෑ. එක වතාවක් ගියා සෞන්දර්ය ආයතනයට ඇතුල් වෙන්න කියලා. ඒකෙදි තිබුණ සම්මුඛ පරීක්ෂණයේදී මට අඳින්න දුන්නේ නිරුවත් ගැහැණියකගෙයි පිරිමියෙකුගෙයි රූපයක්. මම ඒක ඇඳලා ආවා. මේ කතාව ඇහුවට පස්සේ ඉස්කෝලෙනුත් කිව්වා ඕවට යන්න එපා. ඔය තැන්වල ඔය විදිහේ නරක තත්ත්වයක් තමයි තියෙන්නේ කියලා. ඉතිං එතනින්ම ඒ වැඩේ නතර වුණා.

**බොහෝ කලා ශිල්පීන්ට ඒ අයගේ නිර්මාණාත්මක හැකියාවන් වර්ධනය කරගන්න පසුබිම හැදිලා තියෙන්නේ පාසල් කාලයේදී. ඔබට ?**

අනෙක් ළමයි වගේම විෂයක් විදිහට මමත් ඒ කාලේ චිත්‍ර ඉගෙන ගත්තා. ඒ ඇරුණු කොට වෙනත් විශේෂ දෙයක් සිදුවුණේ නෑ. චිත්‍ර අඳින්න පුළුවන්කම තිබුණාට ඉස්කෝලේ යන කාලේ මට තිබුණේ වෙනම පිස්සුවක්. එකක් ෆුඩ් බෝල්. අනිත් එක චිත්‍රපටි. ඔය දෙකට තමයි ඇරිලා හිටියේ. ෆුඩ් බෝල් ගැහිල්ල කොහොමට ගියාද කිව්වොත් මීගමුව ජුපිටර් ෆුඩ් බෝල් සංගමේ කැප්ටන් වෙලත් හිටියා. ඒ කාලේ නිගම්බු ලීඩ් කියලා ෆුඩ් බෝල් තරගාවලියක් තිබුණා. ඒකේ කප් එකත් ගත්තා. ෆුඩ් බෝල් ගහන්න ලංකාව වටේම ගියා. නොගිය තැනක් නෑ. සුද්දෝ එක්ක ගහලත් දිනලා තියනවා. ඒ කාලේ කටුනායක තිබුණා රෝයල් එයාර් ෆෝස් එක. ඒකේ සුද්දෝ එක්කත් මැච් ගහලා අපි දිනලා තියනවා. ඉස්කෝලේ නවයේ පන්තියෙන් පස්සේ වගේ තමයි ක්‍රීඩා සමාජවලට සෙල්ලං කරන්න ගියේ.

චිත්‍රපටි බැලිල්ලත් ඔය වගේම තමයි. එන චිත්‍රපටියක් අරින්නෙම නෑ. හුගාක් චිත්‍රපටි දහ දොළොස් සැරයක් බලනවා. ඒ කාලේ මීගමුව ටවුමේ තිබුණා 'ටෝකීස්' කියලා සිනමා ශාලාවක්. ඔය නම දාල තිබුණේ නිහඬ චිත්‍රපටිවලින් පස්සේ කතානාද චිත්‍රපටි එන්න පටන්ගත්ත කාලේ නිසා. ඒකෙ ගැලරියේ ටිකට් එක ශත 55 යි. මට මතක හැටියට කඩවුණ පොරොන්දුව චිත්‍රපටිය පනස්වතාවකට වැඩිය මම බැලුවා. ඉස්කෝලේ යන කාලේ ඕවා තමයි කළේ.

**ඔය කාලේ කාටුන් ශිල්පියෙක් වීමේ ආශාවක් හරි බලාපොරොත්තුවක් හරි තිබුණේ නැත්ද?**

පොඩි කාලේ ඉඳලා චිත්‍ර ඇන්දට මොකද මම හීනෙකින්වත් හිතුවේ නෑ කාටුන් ශිල්පියෙක් වෙයි කියලා. මට හිතෙන්නේ මගේ ජීවිතය මොකක් හරි නොපෙනෙන බලයක් මගින් ඉදිරියට ගෙනියනවා කියලයි. මොකද මම හිතන පැත්තට නෙවෙයි යන්-න්. හීනෙන්වත් නොහිතන පැතිවලට තල්ලුවෙලා යනවා. කොහොමද එහෙම වුණේ කියලා හරියටම පැහැදිලි කර ගන්න එකත් අමාරුයි. මුලින්ම මට රස්සාව ලැබුණේ පුත්තලම කච්චේරියේ. එතනට ගිහිල්ලත් කළේ ෆුඩ් බෝල් ගහපු එක. පුත්තලමෙන් කොළඹට මාරුවක් ලැබුණා. එතනදි තමයි කාටුන් චිත්‍ර පැත්තට බරවුණේ.

**ලේක්හවුස් ආයතනයේදී දක්ෂතා තියන බොහෝ දෙනෙකුට මුහුණ දෙන්න සිද්ධ වෙන ව්‍යාධියකට ගොදුරුවීමෙන් ඔබටත් එහි රැකියාව අහිමිවීම මොන විදිහටද ජීවියට බලපෑවේ?**

ඒක ඉතාම යහපත් විදිහට තමයි බලපෑවේ. රස්සාව නැතිවුණා කිව්වට මම ලේක්හවුස් එකේ ස්ථිර සේ-වකයෙක් විදිහට නෙවෙයි හිටියේ. නිදහස් කාටුන් ශිල්පියෙක් විදිහටයි. එහෙම ඉඳගෙනත් 1974 වෙන කොට මම සතියකට කාටුන් 17 ක් අඳිනවා. ඔය කාලේ රටේ ආර්ථික ප්‍රශ්ණ බොහොම උග්‍රවෙලා, බඩු මිල බොහොම වැඩිවෙලා තමයි තිබුණේ. මේක ගැන ගුණපාල ජයලත් කාටුන් එකක් ඇඳලා තිබුණා මිනිස්සු ශක්‍ර දෙවියන්ට ගහන්න කැති පොලු උස්සගන දුවනවා. මේකට මමත් සම්බන්ධයි කියලා මගේ වැඩ නැවැත්තුවා. ඊට පස්සේ ටික කාලයක් අනුර බණ්ඩාරනායකගේ 'අද' කියන දේශපාලන පත්තරේ වැඩ කරලා එතනින් අයින්වෙලා 95 දි 'සිත්තර' පත්තරේ පටන්ගත්තා. එතනින් ජීවිතේ අලුත් පාරකට වැටුණා.

**'සිත්තර' පත්තරෙන් වැටුණ අලුත් පාර මොකක්ද?**

සිත්තර ගැහුවේ මල්ටි ෆැක්ස් එකෙන්. චින්තන ජයසේනයි මමයි තමයි පත්තරේ කළේ. 86 වෙනකම් සිත්තර පත්තරේ හිටියා. ඒ කාලේ පිටපත් ලක්ෂ දෙකක් විතර සිත්තර විකුණුනා. ගජමෑන් තීරු කාටු-න් එක සිත්තරේ බොහොම ජනප්‍රිය අංගයක් වුණා. කොච්චර ජනප්‍රිය වුණාද කියනවා නම් 1984 අවුරුද්දේ අලුත් අවුරුද්ද වෙනුවෙන් 'කැමිලස්ගේ ගජමෑන්' කියලා වෙනමම කාටුන් පත්තරයකුත් කළා.

**අද වෙන කොට ඔබ කාටුන් ශිල්පියෙක් විතරක් නොවෙයි. ප්‍රකාශන ආයතනයක හිමිකරුවෙක්. කොහොමද එතැනට ආවේ?**

'කැමිලස්ගේ ගජමෑන්'අලුත් අවුරුදු විශේෂ පත්තරය කළාට පස්සේ 'ගජමෑන්'ගේ අයිතිය සම්බන්ධයෙන් මල්ටි ෆැක්ස් ආයතනයත් මාත් අතරේ මතභේදයක් ඇතිවුණා. මේක දුර දිග ගිහිල්ලා උසාවි යන්නත් සිද්ධ වුණා. ඒ නිසා 86 මම එතනින් අයින් වෙලා 'සත්සිරි' කියලා චිත්‍ර කතා පත්තරයක් ආරම්භ කළා. කැමිලස් ප්‍රකාශන සමාගමේ ආරම්භය සිද්ධ වුණේ ඔය විදිහට. 1986 නොවැම්බර් 24 තමයි 'සත්සිරි' මුල් පිටපත ප්‍රකාශයට පත් කළේ. පස්සේ රූපවාහිනිය ඇවිල්ලා චිත්‍ර කතා පත්තර වැටෙනකම්ම 'සත්සිරි' කළා. මම හිතන්නේ කාටුන් ශිල්පියෙක් විදිහට මාධ්‍ය ක්ෂේත්‍රයට ඇවිල්ලා මේ වගේ ස්ථාවරත්වයකට ආව එකම කෙනා මම.



**ඔබ කාලෙකට පෙර පුවත්පතකට කියලා තිබුණා කාටුන් චිත්‍රපටි කරන්න බලාපොරොත්තුවක් තියනවා කියලා. ඒත් තවමත් ගජමෑන් කාටුන් චිත්‍රපටියක් වුණේ නැත්තේ ඇයි ?**

එක්කෙනෙක් දෙන්නෙක් මගේ ළඟටත් ආවා ගජමෑන් කාටුන් චිත්‍රපටියක් කරන්න කැමතියි කියලා. ඒත් මම ඒකට ඉඩ දුන්නේ නෑ. මොකද මේ වෙනකොට ලංකාවේ කරපු කාටුන් චිත්‍රපටි හැම එකක්ම වගේ අසාර්ථකයි. අවශ්‍ය තාක්ෂණික පහසුකම් නැතිකම නිසා වෙන්න ඇති. අපි කාටුන් චිත්‍රපටියක් කරනවා නම් ඒක කරන්න ඕනේ හොලිවුඩ්වල කෙරෙන නිෂ්පාදනත් එක්කත් තරග කරන්න පුළුවන් මට්ටමෙනුයි. මොකද අද වෙනකොට රූපවාහිනිය නිසා පොඩි ළමයි පවා උසස් තත්ත්වයේ කාටුන් චිත්‍රපටි දැකලා තියෙන්නේ. අපි ඊට වැඩිය පහළ මට්ටමකින් කළොත් ඒක ප්‍රේක්ෂකයන්ගෙන් ප්‍රතික්ශේප වෙනවා. අදටත් මගේ කැමැත්තක් තියනවා ගජමෑන් කාටුන් චිත්‍රපටියක් කරන්න. නමුත තවමත් ඒකට අවශ්‍ය අනෙක් කාරණා සම්පූර්ණ වෙලා නෑ.




සංවාදය හා ඡායාරූප
ශ්‍රීලාල් සෙනෙවිරත්න
srilal333@gmail.com

Dhammika Kulatunga
Ph : 03 9308 1647
Mob : 0411 272 162
DD REFRIGERATION
☆ Installation, repairs & maintenance of Split type air conditioning
☆ Repairs of domestic & commercial refrigerators freezers and cool rooms
☆ Repairs of Electrical Appliences
Fully licensed for air conditioning plumbing